සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත් සභා සංකීර්ණය, නවනගරය, රත්නපුර.
சப்பிரகமுவ மாகாண சபை அரச சேவை ஆணைக்குழு
சப்பிரகமுவ மாகாண சபைக் கட்டிடத் தொகுதி, புதிய நகரம் இரத்தினபுரி.
Sabaragamuwa Provincial Public Service Commission
Sabaragamuwa Provincial Council Complex, New Town, Ratnapura.

මගේ අංකය / எனது இல / My No : PPSC/ES/14/FI/02/36

ඔබේ අංකය / உமது இல / Your No :

දිනය / திகதி / Date : 2024.11. 28

විභාග අයදුම්කරුවන් වෙත,

**සබරගමුව පළාතේ පළාත් සභා පාසල්වල පවතින ගුරු පුරප්පාඩු අ.පො.ස(උ.පෙළ),ප්‍රාථමික,අ.පො.ස(සා.පෙළ) සම්පූර්ණ කිරීම සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයට උපාධිධාරීන් (සිංහල/දෙමළ මාධ්‍යය) බඳවා ගැනීමේ තරග විභාගය 2024- ප්‍රතිඵල නිකුත් කිරීම ලිඛිත විභාගය පැවැත් වූ දිනය (2024.04.07)**

සබරගමුව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අංක MEDU/AD/05/01 හා 2024.11.25 දිනැති ලිපියෙන් ලබා දී ඇති එකඟතාව පරිදි,උක්ත විභාගයේ සම්මුඛ පරීක්ෂණ කටයුතු 2024.11.26 දිනෙන් පසු අවසන් බැවින් 2024.04.07 දින මෙම කොමිෂන් සභා කාර්යාලයෙන් පැවැත් වූ සබරගමුව පළාත් ගුරු 2024 ලිඛිත විවෘත තරග විභාගයට පෙනී සිටි අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ලේඛනය ඔවුන්ගේ දැනගැනීම සඳහා සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියේ (www.spc.sg.gov.lk) ප්‍රසිද්ධ කරන බව කාරුණිකව දන්වමි.

02. සියලු ප්‍රශ්නපත්‍රවලට පෙනී සිට එක් එක් ප්‍රශ්න පත්‍රයට ලකුණු 40 ක් වූ අවම ලකුණු ප්‍රමාණයක් ගන්නා ලද අයදුම්කරුවන් සමත් (Pass) අයදුම්කරුවන් ලෙස සැලකේ.එක් විෂයකට හෝ විෂයයන් දෙකටම ලකුණු 40ට අඩු නම් අසමත් (Fail) ලෙස සලකා ඇත.

03. මෙම අයදුම්කරුවන්ගේ විෂයන් තේරීම්, සුදුසුකම් පරීක්ෂා කිරීම හා ප්‍රායෝගික පරීක්ෂණයේ දී ,ලකුණු ලබා දීම සබරගමුව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සිදු කර ඇත.

04. සබරගමුව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත අයදුම්කරුවන්ගේ ලිඛිත විභාගයේ සමස්ත ප්‍රතිඵල 2024.06.10 දින වන විට මා විසින් නිකුත් කර ඇති අතර,ඒ ලකුණු පදනම් කර බඳවා ගැනීම් සිදු කර ඇත්තේ විෂයභාර අමාත්‍යාංශ ලේකම් වේ.ඒ පිළිබඳව විමසීම් සබරගමුව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කරන මෙන් වැඩිදුරටත් දන්වමි.

05.මෙහි **සමත් ප්‍රතිඵල ලේඛනයේ නම සඳහන් වීම පමණක් පත්වීමක් ලැබීමට අනිවාර්ය හිමිකමක් නොවන බව** සැලකිය යුතු ය.

ආර්.කේ.ඒ.සුනීතා
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත

ආර්.කේ.ඒ. සුනීතා
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත

ලේකම් / செயலாளர் / Secretary 045-2223227
කාර්යාලය / அலுவலகம் / Office 045-2222379
ෆැක්ස් / பெக்ஸ் / Fax 045-2121175
විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-Mail psc.sg.gov.lk ppsc_spc@sltnet.lk